# 1 පරිච්ඡේදය

## 1.1 හැදින්වීම

සමකාලීන ජනමාධ්‍ය සමාජ ජීවිතයේ සියළුම ක්ෂේත්‍ර වලට නොසලකා හැරිය නොහැකි තරමේ බලපෑමක් කරනු ලබයි. එපමණක් නොව සමාජ ජීවිතයේ විවිධ ක්ෂේත්‍ර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් හා අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයක් පවත්වාගෙන යනු ලැබේ. පුවත්පත් මාධ්‍ය ඒ අතරින් ප්‍රධාන වේ. පුවත්පතක් තුළ විවිධ ආකෘතීන් අන්තර්ගත වේ. විශේෂාංග, කතුවැකි, ප්‍රවෘත්ති ආදිය ඉන් ප්‍රධාන වේ. නමුත් මේ අතර විශාල මෙහෙයක් ඉටුකරන නමුත් පුවත්පතක් තුළ අගයක් නොලබන විශේෂාංගයන් ද දක්නට ලැබේ. ඒ අතර කාටූන් කලාව ද වේ. කාටූන් යනු ජනතාවට ඉතා ඉක්මනින් තොරතුරු ලබාදිය හැකි මාධ්‍යක් වේ. මන්ද ඒ තුළ ප්‍රහසනය සැඟවී ඇති බැවිනි.

කාටූන් කලාවේ උපත පෙන්සිල්වේනියාවේ සිදුවුවා යැයි සැලකේ. කාටූන් යනු යම් කිසි කරුණක්, ක්‍රියාවක්, යම් පුද්ගලයෙකු සංකේතවත් කරමින් උපහාසයට ලක් කරන චිත්‍රයක් හෝ චිත්‍ර සමූහයක් වේ.

ලොව මුල්ම කාටූන් චිත්‍ර ශිල්පියා වන්නේ බෙන්ජමින් ෆැන්ක්ලින් (1706-1790)ය. මොහු ප්‍රකාශකයෙක්, මුද්‍රණකරුවෙක් හා රචකයෙක් වන අතර අමෙරිකාවේ මෙන්ම ලෝකයේ ද ප්‍රථම කාටූන් ශිල්පියාද වේ.

1754 මැයි 09 දින "පෙන්සිල්වේනියා ගැසට්" ( Penisylvania Gazette) පත්‍රයේ පළ වූ විකට චිත්‍රය ලෝකයේ ප්‍රථම විකට චිත්‍රය වේ. බ්‍රිතාන්‍යයට විරුද්ධ ප්‍රංශ හා ඉන්දියානු යටත් විජිත ප්‍රදේශ එකතු කරමින් එක්සත් පෙරමුණක් පිහිටුවා ගත යුතු බවට අදහසක් මෙහි දැක්වේ. මෙය කොටස් 8 කට කැඩී ගිය නාගයෙකි. මේ නාගයාගේ හිස නිව් ඉන්ග්ලන්ඩය. ඉතිරි කොටස් 7 න් අනෙක් ජනපද සංකේතවත් කෙරිණි. ඊට පහලින් මෙසේ සඳහන්ය.

"Join or Die"

" එකතු වෙනු නැත්නම් මැරෙනු" ලෙසය. මෙම කාටූනය ඇමෙරිකන් නිදහස් සටනට බොහෝ සේ බලපෑවේය.

ෆැන්ක්ලින්ගේ මෙම කාටූනය නිසා ඇති වූ පිබිදීම ඉන් අනතුරුව ලොව පුරා ව්‍යාප්ත වන්නට විය.මෙසේ ව්‍යාප්ත වූ කාටූන් කලාව මේ වන විට පුවත්පතක අනිවාර්ය අංගයක් බවට පත්ව තිබේ. ඒ අනුව මේ වන විට පුවත්පතක කාටූන් ප්‍රධාන කොටස් කිහිපයකට වර්ග කල හැක.

එනම්,

- තීරු කාටූන්
- පොකට් කාටූන්
- විහිළු රූප කාටූන්
- සන්නිදර්ශන කාටූන්
- දේශපාලන කාටූන්

මෙම කාටූන් ලංකාවේ මෙන්ම ලෝකයේද දිනපතා පුවත්පත්, සති අන්ත පුවත්පත්, සඟරා ආදියෙහි ඉහත එක් ආකාරයකින් හෝ දැකිය හැකි වේ. නමුත් ලංකාවේ බොහෝ පුවත්පත් ගත් විට බහුලව දක්නට ලැබෙන්නේ දේශපාලන කාටූන් හා පොකට් කාටූන් පමණි. පුවත්පතක් ආරම්භ කරන විටම දේශපාලන කාටූන් හා පොකට් කාටූන් ඉදිරිපත් කිරීම නිතරම දක්නට ලැබේ.

උදාහරණ - ⋆ 1991 "රාවය" ආරම්භ කරන විට "ආයුබෝවන්" නම් පොකට් කාටූනයද
⋆ 1961 "දවස" පුවත්පත ආරම්භ කරන විට "අබරං සියාගේ දවසේ කියමන" නම් පොකට් කාටූනයද, අන්තගතයේ හි සන්නාදර්ශන කාටූනයක්ද දක්නට ලැබේ.

නමුත් කාටූන් පුවත්පත තුළ කෙතරම් අන්තර්ගත වුවද ඒ පිළිබඳ සඳහන් වූ ග්‍රන්ථ සොයා ගැනීම අපහසු වේ. මන්ද ලෝකය තුළ මෙන්ම ලංකාවේ ද කාටූන් පිළිබඳ ලියන ලද පොත පත ඇත්තේ කිහිපයක් බැවිනි.

ලංකාවේ දේශපාලන කාටූන් අපට හමුවන්නේ නිදහසින් පසු යුගයේදීය. ඊට පෙර පුවත්පත් තිබුනද කාටූන් කලාවක් දක්නට නොතිබිනි. නිදහස ලැබීමත් සමඟ කොලට්, පී ඇස් ප්‍රනාන්දු, අමිත අබේසේකර වැනි ශිල්පීන් බිහි විය. නමුත් පොකට් කාටූනයේ ඉතිහාසයේ මුල්ම ශිල්පීන් සෙවීමට අපහසු වී ඇත.මන්ද ඒ පිළිබඳ සටහනක් ඉතිහාසය තුළ දක්නට නොමැති බැවිනි.

කාටූන් චිත්‍ර වලින් පල කරන සන්නිවේදන ලක්‍ෂණ විශාල වේ. ඒ සාක්‍ෂරතාව බොහෝ විට කාටූන් සඳහා අවශ්‍ය නොවෙන බැවිනි. නමුත් පුවත්පත් තමන්ගේ මතවාද අනුව එකම සිද්ධිය විවිධ ආකාරයට ඉදිරිපත් කෙරේ. මේ අනුව සන්නිවේදනයේ ප්‍රධාන පරමාර්ථ වූ තොරතුරු සම්පාදනය, මතවාද ගොඩ නැගීම, ප්‍රතිෂ්ඨාපනය, අධ්‍යාපනය කාටූන් කලාව තුළින් ඉටු නොවනවා යැයි කිව නොහැක. මෙහිදී බහුතරයකගේ චින්තනය වෙනස් කිරීමට නොහැකි වුවත් යම් ප්‍රශ්නයක් පිළිබඳ ව බහුතරයකගේ අවධානය යොමු කර ඔවුන්ගේ සිතුවිලි වල වෙනසක් ඇති කිරීමේ හැකියාවක් කාටූන් වල දක්නට ලැබේ.එබැවින් මිනිස් ජන විඥානයට කාටූන් වලට බලපෑමක් කල හැකි බව මාගේ හැගීමයි.